# සහකාර ඉන්දියානු මහ කොමසාරිස් කාර්යලය

# මහනුවර

***

## මාධ්‍ය නිකුත් කිරීම

### ඉන්දීය නියෝජ්‍ය මහ කොමසාරිස්වරයා මධ්‍යම පළාතේ සංචාරය කිරීම.

ශ්‍රී ලංකාවේ ඉන්දීය නියෝජ්‍ය මහ කොමසාරිස් (DHC) විනෝද් කේ. ජේකබ් මහතා 2022 නොවැම්බර් 23-25 දක්වා මධ්‍යම පළාතේ (නුවරඑළිය සහ මහනුවර) සංචාරයක නිරත විය.

2. නියෝජ්‍ය මහ කොමසාරිස්වරයා නුවරඑළියේ සිට සිය සංචාරය ආරම්භ කළ අතර, හැටන් තොණ්ඩමන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයට (TVTC) ගොස් TVTC හි ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සමඟ කටයුතු කළේය. TVTC වැඩිදියුණු කිරීම ඉන්දියාවේ දැනට පවතින සංවර්ධන ව්‍යාපෘතිවලින් එකකි. නියෝජ්‍ය මහකොමසාරිස් දික්ඔය මූලික රෝහලේ ද නිරීක්ෂණ චාරිකාවක නිරත විය. හිටපු අමාත්‍ය සහ පාර්ලිමේන්තු මන්ත්‍රී මුත්තු සිවලිංගම් මහතාගේ ශෝකජනක අභාවය පිළිබඳව නියෝජ්‍ය මහ කොමසාරිස්වරයා ශෝකය පළ කළේය.

3. නොවැම්බර් 24 වැනි දින නියෝජ්‍ය මහ කොමසාරිස්වරයා මධ්‍යම පළාත් ආණ්ඩුකාර අතිගරු ලලිත් යූ.ගමගේ මහතා හමුවිය. මධ්‍යම පළාතේ සංවර්ධන ව්‍යාපෘතිවලට අමතරව මෑත කාලීන අර්බුදය සමනය කිරීමට ඉන්දීය රජය විසින් ලබා දෙන සහය සඳහා ආණ්ඩුකාරවරයා සිය කෘතඥතාව පළ කළේය. ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර ද්විපාර්ශ්වික සබඳතා, ඓතිහාසික හා සංස්කෘතික සබඳතා පිළිබඳව ඔවුන් අදහස් හුවමාරු කර ගත්හ. 2023 වසරේ ඉන්දියාව විසින් G20 සහ SCO හි සභාපතිත්වය දැරීම, ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ වසර 75ක ද්විපාර්ශ්වික සබඳතා සහ මහනුවර සහකාර මහ කොමසාරිස් කාර්යලය පිහිටුවා වසර 100 ක් සපිරෙන බව ආදී කරුණු පිළිබඳව ආණ්ඩුකාරවරයාව දැනුවත් කරන ලදී. නියෝජ්‍ය සහකාර මහකොමසාරිසවරයා විසින් පල්ලෙකැලේ, සිබා විශ්වවිද්‍යාලය වෙත ගොස් ඉන්දීය රජයේ ආධාර යටතේ ගොඩනැගෙන උඩරට නැටුම් පාසල සංවර්ධන ව්‍යාපෘතියේ ඉදිකිරීම් ප්‍රගතිය සමාලෝචනය කිරීමට ගිය අතර එහිදී ඔහු ගරු දියවඩන නිලමේ ආචාර්ය ප්‍රදීප් නිලංග දෑල මහතා ද මුණ ගැසුණි.

4. නොවැම්බර් 25 වන දින, නියෝජ්‍ය සහකාර මහ කොමසාරිස්වරයා විසින් ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ‘2022 ජාත්‍යන්තර සතිය’ සමාප්ති උත්සවයේ

සංස්කෘතික උළෙල ආරම්භ කරන ලදී. නියෝජ්‍ය මහ කොමසාරිස්වරයා, සමාරම්භක කථාවේදී, හවුල් උනන්දුවකින් අසල්වැසියන් ලෙස, අපගේ සංස්කෘතික සබඳතා අගය කළ යුතු, ආරක්ෂා කර ප්‍රවර්ධනය කළ යුතු බව සඳහන් කළේය. ඉන්දියාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා දිනය සැමරීම සඳහා, විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය එම්. ඩී. ළමාවංශ මහතා සමගින් නියෝජ්‍ය මහ කොමසාරිස්වරයා විසින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ හි ප්‍රධාන පුස්තකාලයේ 'ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සකස් කිරීම' පිළිබඳ ඡායාරූප ප්‍රදර්ශනය ආරම්භ කරන ලදී. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ නීති අධ්‍යනාංශය විසින් ඉන්දීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ කමිටු සාකච්ඡාවක් සංවිධානය කරන ලද අතර, එහි ප්‍රධාන දේශකයන් ලෙස නියෝජ්‍ය මහ කොමසාරිස් විනෝද් කේ. ජේකබ් මහතා සහ නීති අධ්‍යනාංශයේ ප්‍රධානී මහාචාර්ය දීපිකා උඩගම සහභාගි වූහ. ගැටඹේ රාජෝපවනාරාමයේ සංවිධානය කර තිබූ උත්සවයකදී නියෝජ්‍ය මහ කොමසාරිස්වරයා විසින් අතිපූජ්‍ය කැප්පිටියාගොඩ ශ්‍රී විමල ස්වාමින් වහන්සේ වෙත E-නැණසල සඳහා පරිගණක ප්‍රදානය කරන ලදී. ස්වාමීන්වහන්සේ ඉන්දියාවේ සහය වීම ගැන ස්තුතිවන්ත වූහ.

***

මහනුවර

26.11.2022